අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/ 01 /11 /04/10-2023 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2023.04.18

**චක්‍රලේඛ අංක :16/2023**

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලා,
සියලුම විදුහල්පතිවරුන්,

**ශ්‍රී බුද්ධ වර්ෂ 2567 වන වෙසක් සතිය**

2023 මැයි මස 05 වන දිනට යෙදී ඇති ශ්‍රී බුද්ධ වර්ෂ 2567 වන වෙසක් දිනය නිමිත්තෙන් රාජ්‍ය වෙසක් උත්සවය 2023 මැයි මස 04 සහ 05 දෙදින පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත, මාදම්පේ, කැබැල්ලෑවල ශ්‍රී රතනසිරි පිරිවෙන් විහාරස්ථානයේ දී පැවැත්වීමට බුද්ධ ශාසන අමාත්‍යාංශය කටයුතු යොදා ඇත.

2023.05.02 වන දින සිට 2023.05.08 වන දින දක්වා (දෙදිනම ඇතුළත්ව) "වෙසක් සතිය" වැඩසටහන අදාළ පාසල්, විද්‍යාපීඨ, පිරිවෙන් හා ගුරු විද්‍යාල පරිශ්‍රයන්හි ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු සංවිධානය කළ යුතු වේ.

මෙම වෙසක් සතිය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ආදර්ශ සැලැස්ම පහතින් ඉදිරිපත් කර ඇති අතර එම වැඩසටහන් අදාළ පාසල් සහ අධ්‍යාපන ආයතනවල සුදුසු පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු සලසන මෙන් දන්වමි.

**මෙවර වෙසක් සතිය සඳහා යෝජිත තේමාව වන්නේ,**

**"අවජ්ජේ වජ්ජමතිනො - වජ්ජේ චාවජ්ජදස්සිනො**
**මිච්ඡාදිට්ඨිසමාදානා - සත්තා ගච්ඡන්ති දුග්ගතිං"**
**"නිවැරදි දේ වැරදි ලෙසත් , වැරදි දේ නිවැරදි ලෙසත් දැකීම දුගතියට හේතු වේ".**

**යෝජිත වෙසක් සතියේ ආදර්ශ වැඩ සැලැස්ම.**

| දිනය | තේමාව | යෝජිත ක්‍රියාකාරකම් |
|---|---|---|
| 2023 මැයි මස 02 වන අඟහරුවාදා | **"තිරසර පරිසරයක් සඳහා බුදුදහම"** **පරිසර සංරක්ෂණ වැඩසටහන්** | • බුදුරජාණන්වහන්සේගේ ඉගැන්වීම් ඇසුරින් පරිසර හිතකාමී පිරිසක් බිහි කිරීම සඳහා පරිසරයේ වටිනාකම සිසු සිසුවියන්ට අවබෝධ කර දීම හා "බුදු දහම හා පරිසරය" තේමා කර ගනිමින් දේශන, වැඩමුළු ආදිය පැවැත්වීම.<br>• පරිසරය රැක ගැනීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>• පාසල, ආයතනය, ආගමික සිද්ධස්ථාන, නිවස ආදියෙහි අවට පිරිසිදු කිරීම සහ වෙසක් පහන් කූඩු.(ඉටිකොළ භාවිතයෙන් තොරව) සකස් කිරීම සහ සැරසීම.<br>• "සති භාවනා" වැඩසටහන පැවැත්වීම. |
| 2023 මැයි මස 03 වන බදාදා | **"සිල් සුවඳින් නිරතුරු කුසල් රැස් කරන්න" සීල භාවනා පිංකම්** | • අධ්‍යාත්මික සංවර්ධනය සඳහා සිසු සිසුවියන්ට සීල භාවනා වැඩසටහන් පැවැත්වීම.<br>• "සති භාවනා" වැඩසටහන පැවැත්වීම. |

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister +94112784832 +94112784825 minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary +94112784811 +94112785162 secretary.education@moe.gov.lk

| | | |
|---|---|---|
| මැයි මස 04 වන බ්‍රහස්පතින්දා | **"සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා බුදුදහම"** | • නිරෝගීභාවයේ සහ මානසික සුවතාවයෙහි වටිනාකම සිසු සිසුවියන්ට අවබෝධ කර දීම.<br>• වස විසෙන් තොර දේශීය ආහාර භෝග වගා කිරීම හා පරිභෝජනයට උනන්දු කිරීම හා සම්බන්ධ දේශන, සම්මන්ත්‍රණ ආදිය පැවැත්වීම.<br>• "සති භාවනා" වැඩසටහන පැවැත්වීම. |
| මැයි මස 05 වන සිකුරාදා (වෙසක් පුර පසළොස්වක පොහෝ දිනය) | **"කායික වාචසික සංවරය සීලයයි "**<br><br>**(කාය වාචානං සමොදානං සීලං)** | • ආසන්නතම විහාරස්ථානයට ගොස් සිල් සමාදන් වීම, ධර්මදේශනා හා භාවනා ආදී ප්‍රතිපත්ති පූජාවලට සහභාගී වීම හා සිල් සමාදන් වූ උවැසි උවැසියන්ට උපස්ථාන කිරීම. |
| මැයි මස 06 වන සෙනසුරාදා | **"බුදුදහමින් පෝෂිත වූ හෙළ කලාව"** | • පැරණි බෞද්ධ කලා ශිල්ප පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීම සඳහා තම නිවසට ආසන්න බෞද්ධ සිද්ධස්ථානවලට ගොස් ඒවායේ පූජනීය වස්තූන් හා පැරණි කලාකෘතීන් නිරීක්ෂණය කර දැනුම ලබා ගැනීමට මග පෙන්වීම. |
| මැයි මස 07 වන ඉරිදා | **"බුදුදහමින් පෝෂිත වූ සිංහල සාහිත්‍යය"** | • සැදැහැ ගී ගායනා හා බෞද්ධ නාට්‍ය රඟ දැක්වීම වැනි සෞන්දර්යාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>• බෞද්ධ දර්ශනය මූලික කරගෙන පෝෂණය වූ සාහිත්‍යය පිළිබඳ පාසල් දැනුවත් කිරීම හා සාහිත්‍ය නිර්මාණ සඳහා සිසුන් පෙළඹවීමට වැඩසටහන් පැවැත්වීම.<br>• විහාරස්ථාන කේන්ද්‍ර කර ගනිමින් ධර්ම දේශනා, ධර්ම සාකච්ඡා, කවිබණ ධර්ම දේශනා සහ භාවනා වැඩසටහන් ආදිය පැවැත්වීම. |
| මැයි මස 08 වන සඳුදා | **"සාරධර්ම ප්‍රවර්ධනය"** | • බුදු දහම හා සිරිත් විරිත්, සාරධර්ම පිළිබඳ අවබෝධයක් ලබා දීම සහ සිසු සිසුවියන් තුළ සතිමත් බව වර්ධනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>• මත්ද්‍රව්‍ය හා දුම්වැටි නිවාරණ වැඩසටහන් සංවිධානය කිරීම සහ ආරෝග්‍යශාලා හා වැඩිහිටි නිවාස, ළමා නිවාස ආදියෙහි සමාජ සත්කාරක වැඩසටහන් සංවිධානය කිරීම. |

ඉහත වෙසක් සතිය තුළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී, ආයතනික වශයෙන් සුදුසු ලෙස දින සහ වේලාවන් යොදා ගත හැකිය. කුමන හේතුවක් නිසා හෝ බෞද්ධ ආගමට නිගරු වන ආකාරයේ සංදර්ශන හා ක්‍රීඩා සහ එවැනි වෙනත් වැඩසටහන් පැවැත්වීමෙන් වැලකිය යුතු වේ. සිසු සිසුවියන් හා පාසල්/ආයතන ප්‍රජාව අතර ආගමික සංහිඳියාව ගොඩනැගෙන අයුරින් කටයුතු කිරීමට විදුහල්පතිවරුන් සහ ආයතන බලධාරීන්ගේ අවධානය යොමු විය යුතුය.

එම්.එන් රණසිංහ
අධ්‍යාපන ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම් -ජනාධිපති ලේකම් කාර්යාලය
2. ලේකම් - බුද්ධ ශාසන, ආගමික සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
3. ප්‍රධාන ලේකම්වරුන් - සියලුම පළාත්

(1–3) } කරු.දැ.ගැ .ස හා අ.ක. ස

4. ලේකම් - දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය
5. විද්‍යාපීඨ කොමසාරිස් - සියලු විද්‍යාපීඨ දැනුවත් කිරීමට හා අ.ක.ස
6. ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ - සියලු ජාතික පාසල් දැනුවත් කිරීමට හා අ.ක.ස
7. පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ - සියලු පිරිවෙන් අධ්‍යාපන ආයතන දැනුවත් කිරීමට හා අ.ක.ස